සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved]

නව නිර්දේශය / புதிய பாடத்திட்டம் / New Syllabus

NEW

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2019 අගෝස්තු
கல்விப் பொதுத் தராதரப் பத்திர (உயர் தர)ப் பரீட்சை, 2019 ஓகஸ்ற்
General Certificate of Education (Adv. Level) Examination, August 2019

2019.08.07/ 0830 - 1030

නර්තනය (භරත) I
நாட்டியம் (பரதம்) I
Dancing (Baratha) I

53 S I

පැය දෙකයි
இரண்டு மணித்தியாலம்
Two hours

**උපදෙස්:**

- **සියලු ම** ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
- පිළිතුරු පත්‍රයේ නියමිත ස්ථානයේ ඔබේ **විභාග අංකය** ලියන්න.
- පිළිතුරු පත්‍රයේ දී ඇති උපදෙස් ද සැලකිල්ලෙන් කියවා පිළිපදින්න.
- **1** සිට **50** තෙක් එක් එක් ප්‍රශ්නයට (1), (2), (3), (4), (5) යන පිළිතුරුවලින් **නිවැරදි හෝ ඉතාමත් ගැළපෙන හෝ** පිළිතුර තෝරාගෙන, එය, **පිළිතුරු පත්‍රයේ පිටුපස දැක්වෙන උපදෙස් පරිදි කතිරයක්** (X) **යොදා දක්වන්න**.

**1.** "අම්මෙයේ අප්පා ඔප්පිලා මනියේ..." යන පද්‍යයෙන් ආමන්ත්‍රණය කරනුයේ,
(1) ගණ දෙවියන් ය. (2) ශිව දෙවියන් ය. (3) මුරුගන් දෙවියන් ය.
(4) විෂ්ණු දෙවියන් ය. (5) වයිරවර් දෙවියන් ය.

**2.** සාත්වික භාවයේ 'වයිවරණය' යනු,
(1) හඬ වෙනස්වීම ය. (2) වෙව්ලීම ය. (3) හිරිගඩු පිපීම ය.
(4) කඳුලු ගැලීම ය. (5) ශරීර වර්ණය වෙනස්වීම ය.

**3.** ජති හෝ ගීත විෂමග්‍රහයෙහි පිහිටා ආරම්භ කිරීමට යොදන නාමය වනුයේ,
(1) අතීත කාලය වේ. (2) කාක පාදය වේ.
(3) සමග්‍රහ වේ. (4) ප්ලුත වේ.
(5) අනාගත කාලය වේ.

**4.** අභිනය යන්නට කණ්ණාඩිය යනුවෙන් අර්ථ දැක්වෙන ග්‍රන්ථය වනුයේ,
(1) නාට්‍ය ශාස්ත්‍රය ය. (2) අභිනය සාර සම්පුටම් ය.
(3) අභිනය දර්පණය ය. (4) පංචමරපු ය.
(5) අභිනය නව නීතම් ය.

**5.** 'පුරුකු' නම් සැහැල්ලු ලීයෙන් සෑදූ ආභරණ පැළඳ නර්තනයේ නියැළෙන සම්ප්‍රදාය වනුයේ,
(1) භරත නාට්‍යම් ය. (2) මෝහිණී ආට්ටම් ය.
(3) කතකලි ය. (4) කුච්චිපුඩි ය.
(5) ඔඩිසි ය.

**6.** නාට්‍ය ශාස්ත්‍රයේ කරණ 108 අර්ථ දැක්වෙන පරිච්ඡේදය වනුයේ,
(1) සිව් වන පරිච්ඡේදය ය. (2) දස වන පරිච්ඡේදය ය.
(3) අට වන පරිච්ඡේදය ය. (4) පස් වන පරිච්ඡේදය ය.
(5) දෙවන පරිච්ඡේදය ය.

**7.** නිශ්චිත ස්ථානයකට ප්‍රේමවන්තයාගේ නොපැමිණීම නිසා රැවටීම හා ලැජ්ජාවට පත් වන අෂ්ටවිද නායිකාවන්ගෙන් කෙනෙකු වන්නේ,
(1) ස්වාධීන පතිකා නායිකා ය. (2) විප්‍රලප්තා නායිකා ය. (3) අභිසාරිකා නායිකා ය.
(4) ඛණ්ඩිතා නායිකා ය. (5) විරහෝත්ඛණ්ඩිතා නායිකා ය.

**8.** විභාව තුළින් මතුවන ඵලය
(1) ස්ථායි භාව වේ. (2) සංචාරී භාව වේ. (3) සාත්වික භාව වේ.
(4) අනුභාව වේ. (5) විභාව වේ.

[ දෙවැනි පිටුව බලන්න.

**9.** නර්තන විධි එකොළසකින් තුඩි නම් නර්තන විධිය රඟ දැක් වූ දෙවියා වනුයේ,
(1) තිරුමාල් දෙවියන් ය. (2) තිරුමහල් දෙවියන් ය.
(3) මුරුගන් දෙවියන් ය. (4) ශිව දෙවියන් ය.
(5) කාලි දෙවඟන ය.

**10.** පල්ලව යුගයට අයත් කෝවිල්වල විසූ දේවාදාසීන් 'සේයිලෛයාර්' යනුවෙන් හැඳින්වූ භක්ති සාහිත්‍ය
(1) තේවාරම් ය. (2) තිරුමන්දිරම් ය. (3) පෙරිය පුරාණම් ය.
(4) ආල්වාර් පාසුරන්ගල් ය. (5) තිරුවාලංකාට්ටු මූත්ත තිරුප්පදිහම් ය.

**11.** උඩරට ප්‍රදේශයට ආවේණික කුත්තු ශෛලී පිළිබඳ පමණක් සඳහන් වරණය තෝරන්න.
(1) වසන්තම් කුත්තු හා වාසාප්පු කුත්තු (2) වඩමෝඩි කුත්තු හා තෙන්මෝඩි කුත්තු
(3) අරුච්චුනන් තපසු සහ කාමන් කුත්තු (4) වඩපාංගු කුත්තු සහ තෙන්පාංගු කුත්තු
(5) මගිඩික් කුත්තු සහ පරෙමේල කුත්තු

**12.** පන්තේරු නම් නර්තන අංගය අයත් ශාස්ත්‍රීය නර්තන සම්ප්‍රදාය කුමක් ද?
(1) සබරගමුව සම්ප්‍රදාය (2) පහතරට සම්ප්‍රදාය (3) කෝලම් සම්ප්‍රදාය
(4) සොකරි සම්ප්‍රදාය (5) උඩරට සම්ප්‍රදාය

**13.** "උදරා" නම් චතුර්විධ නාටකයෙහි රඟ දැක් වූ ස්ත්‍රිය, රඝුනාදනායකර් විසින් හඳුන්වා දෙනුයේ,
(1) ඌර්වෂීය ලෙස ය. (2) චන්ද්‍රලේඛා ලෙස ය.
(3) රම්පා ලෙස ය. (4) රූපවතී ලෙස ය.
(5) කෝමලවල්ලී ලෙස ය.

**14.** අෂ්ටපදී නම් නර්තන අංග ගීත රචිත භාෂා මාධ්‍යය කුමක් ද?
(1) දෙමළ (2) වඩමොලි (3) තෙලිඟු
(4) කණ්නඩ (5) හින්දි

**15.** සංකීර්ණ ජතී ධ්‍රැව තාලය, තිශ්‍ර ජතියට හැරවීමේ දී ලබා ගත හැකි මාත්‍රා සංඛ්‍යාව
(1) 14 කි. (2) 17 කි. (3) 23 කි. (4) 29 කි. (5) 87 කි.

**16.** වීණාව සෑදීම සඳහා භාවිතයට ගනු ලබන දැව වර්ග වනුයේ
(1) අඹ, කොහොඹ, තේක්ක ය. (2) කඳු කොහොඹ, නුග, බෝ ය.
(3) තිරුවාති, කොහොඹ, දං ය. (4) කොස්, කළුවර, ආඩුම්බර ය.
(5) ගන්සූරිය, දං, දිවුල් ය.

**17.** 'කෝෂයාත්‍රා' නම් ග්‍රන්ථයෙහි සඳහන් ශාස්ත්‍රීය නැටුම,
(1) භරත නාට්‍යම් ය. (2) මෝහිණී ආට්ටම් ය. (3) කුච්චිපුඩි ය.
(4) කතකලි ය. (5) ඔඩිසි ය.

**18.** රජ මාලිගාව, කඳු, ගස්, යනාදිය ප්‍රාසංගික නිරූපණය කිරීමේ ආහාර්ය අභින විශේෂය වනුයේ
(1) අලංකාරය ය. (2) අංග රචනා ය. (3) පූෂ්ටම් ය. (4) සංජීවම් ය. (5) අභිසාරී ය.

**19.** කතකලි අංග රචනයේ දී කොළ පැහැයෙන් මුහුණ වර්ණ ගන්වනුයේ,
(1) නපුරු චරිත ය. (2) අර්ධ මිනිස් චරිත හා අර්ධ වානර දේව ය.
(3) වනචාරී චරිත ය. (4) ධාර්මික චරිත ය.
(5) ආදිවාසී චරිත ය.

**20.** පූර්වාංගය හා උත්තරාංගය යන ආකෘති අයත් නර්තන අංගය
(1) පදම් ය. (2) කීර්තනම් ය. (3) පද වර්ණම් ය.
(4) තිල්ලානා ය. (5) ශබ්දම් ය.

**21.** ශ්‍රී ලංකාවේ පළමුවරට ලලිත කලාවේදී උපාධිය පිරිනැමූ විශ්වවිද්‍යාලය
(1) යාපන විශ්වවිද්‍යාලයේ රාමනාදන් ඇකඩමිය ය.
(2) රුහුණු විශ්වවිද්‍යාලය ය.
(3) ස්වාමි විපුලානන්ද ලලිත කලායතනය නැගෙනහිර විශ්වවිද්‍යාලය ය.
(4) රජරට විශ්ව විද්‍යාලය ය.
(5) කොළඹ සෞන්දර්ය කලා විශ්වවිද්‍යාලය ය.

**22.** තක දිකු තදිංගිනතොම්, තක තදිංගිනතොම්, තදිංගිනතොම්, ගිනතොම් යන අවසාන තීර්මානට අන්තර්ගත ජති වර්ගය වනුයේ,
(1) ඩමරුක ජති ය. (2) කෝපුච්ච ජති ය.
(3) ශ්‍රෝතෝවක ජති ය. (4) විෂම ජති ය.
(5) මෘදංග ජති ය.

**23.** ශාකුන්තලය නාටකයේ ශෝක රසයේ ආලම්බන විභවයට අදාළ නිවැරදි වරණය තෝරන්න.
(1) වෙව්ලීම (2) ක්ලාන්තය (3) කඳුලු ගැලීම
(4) හෘද ස්පන්දනය වැඩිවීම (5) ශාප කිරීම

**24.** ගැමි ජන සමාජය නිරූපණය සඳහා යොදාගත හැකි ශබ්ද උපක්‍රමය වනුයේ,
(1) කෝලාහල හඬ සහ බල්ලන් බුරන ශබ්දය ය.
(2) කාර් රථ, බස් රථ හා ත්‍රීවිල් යන වාහන ධාවනයේ දී නැගෙන ශබ්ද ය.
(3) වෙළෙඳ පොළක ශබ්දය හා ධාවනය වන දුම්රියක ශබ්දය ය.
(4) තිරික්කල ශබ්දය හා නෙලුම් ඕසය ය.
(5) බකමූණු හා කුරුල්ලන්ගේ කිචි බිචි හඬ ය.

**25.** දෑතට වර්ණවත් ලේන්සු ගනිමින් සිදු කරන ජන නැටුමක් වන්නේ,
(1) කෝලාට්ටම් ය. (2) බොම්මලාට්ටම් ය. (3) කාවඩි ය.
(4) මයිලාට්ටම් ය. (5) ඔයිලාට්ටම් ය.

**26.** ලඝු මාත්‍රයක අගය තීරණය කරනුයේ,
(1) ක්‍රම ය. (2) ජාති ය. (3) ක්‍රියා ය. (4) මාර්ග ය. (5) කාලය ය.

**27.** අතීතයේ දී වර්ෂාපතනය අපේක්ෂාවෙන් සිදු කරන ලද කුත්තු විශේෂය,
(1) මහිඩික් කුත්තු ය. (2) වඩමෝඩි කුත්තු ය. (3) තෙන්මෝඩි කුත්තු ය.
(4) වසන්තම් කුත්තු ය. (5) කාමන් කුත්තු ය.

**28.** නටරාජා ප්‍රතිමාවෙහි නිරූපිත අංග ලක්ෂණ අතෙන් අධිශක්තිය නිරූපණය කරනුයේ මින් කුමකින් ද?
(1) මඳහාසය (2) අඬහඳ (3) ගංගා නදිය
(4) තෙවෙනි ඇස (5) මුවා

**29.** ස්ථායි භාවයේ විශ්මය වනුයේ,
(1) වෛරය ය. (2) කෝපය ය. (3) උත්සාහය ය. (4) ශාන්ත ය. (5) පුදුමය ය.

**30.** 'සඳුර්තන්ඩි ප්‍රකාශිකා' යන ග්‍රන්ථයෙහි මේල හා රාග 72 පිළිබඳ ඍජු අර්ථ ප්‍රකාශනයක යෙදුණේ,
(1) ත්‍යාගරාජා ස්වාමි ය. (2) වේංගඩමගි ය. (3) පරදර් ය.
(4) නන්දිකේශ්වර ය. (5) තණ්ඩු මුනිවර ය.

**31.** තන්ජාවූර් සහෝදරයින්ගේ පියා වනුයේ
(1) තන්ජාවූර් සුබ්බරායා නට්ටුවනාර් ය. (2) මුතු තාණ්ඩවර් ය.
(3) අරුණාචල නට්ටුවනාර් ය. (4) ගංගෛමුත්තු නට්ටුවනාර් ය.
(5) පන්දනෙ නල්ලූර් මීනාක්ෂි සුන්දරම් පිල්ලෙ ය.

**32.** තුති ශෛලියේ දී අවස්ථානුකූලව අත්‍ය, වේශයකට පරිවර්තනය විය හැකි අතිදක්ෂ නිරූපණ ශිල්පිණිය වනුයේ,
(1) තුති ය. (2) සගි ය. (3) තාත්රේයි ය. (4) ඉලිංගිනී ය. (5) සේඩි ය.

**33.** එක් මුහුණතින් යුතු, සමින් බඳින ලද වාද්‍ය භාණ්ඩය කුමක් ද?
(1) තප්පු (2) තවිල් (3) මෘදංගය (4) මද්දලය (5) උරුමි

**34.** පළමුවන 'තත් තෙයි තාම් - දිත් තෙයි තාම්' යන අඩව්වෙහි අවසානයේ භාවිත උත්පලවන පාද භේදය වනුයේ,
(1) කුට්ටනම් ය. (2) කත්තරි ය. (3) මෝට්තම් ය.
(4) අලගම් ය. (5) අශ්වෝද්පලවනම් ය.

**35.** "එඩුත්ත පොට් පාදමුම් කානප් පෙට්රාල් ...... " යන අප්පර් පද්‍යයෙන් නිරූපිත දේව රූපය

(1) අර්ධනාරීශ්වර ය. (2) සෝමස්කන්ධ ය.
(3) ලිංග්කෝට්පවර් ය. (4) පරමේශ්වර ය.
(5) නඩරාජා ය.

**36.** ;;;, ත, දිං, ගි, න, තොමිත,/ තිං, ගි, න, තොමිත/, තිං, ගි, න, තොම් // යන තාලාංගයේ අන්තර්ගත විය යුතු තතිංගිනතොම් පිහිටා ඇති ජාතිය කුමක් ද?

(1) සංකීර්ණ ය. (2) තිශ්‍ර ය. (3) ඛණ්ඩ ය. (4) චතුරස්‍ර ය. (5) මිශ්‍ර ය.

**37.** වචනයෙන් හා ක්‍රියාවෙන් උපහාසය නිරූපණය කර, කථාව හා සම්බන්ධය ඇති කරන 'කෝනංගි' නම් පාත්‍ර විශේෂය අයත් නර්තන වර්ගය වනුයේ,

(1) යක්ෂගාන ය. (2) කුට්ට්‍රාල කුරවංජි ය. (3) ඔඩිසි ය.
(4) මණිපුරි ය. (5) පාහවද මේලම් ය.

**38.** ධීර ශාන්ත යන නායක භේදයට උදාහරණය වනුයේ,

(1) බුදුන් වහන්සේ ය. (2) රාවණා ය. (3) ශ්‍රී ක්‍රිෂ්ණ දෙවි ය.
(4) කෝවලන් ය. (5) අර්ජුන ය.

**39.** තලෛකෝලියර් නැටුම් ගුරුවරු විසූ බවට "අරංගියල් මගලිර්ක්කු ආඩල් වගුක්කුම් තලෛක්කෝල් පෙන්ඩිර්" පද්‍ය මගින් අර්ථ ගැන්වෙන ග්‍රන්ථය වන්නේ,

(1) සීලප්පදිකාරම් ය. (2) කුනනූල් ය. (3) සයන්දම් ය.
(4) මණිමේකලා ය. (5) පෙරුංකදෛ ය.

**40.** 'තකදිමි තකිට' ජාතියේ අයත් තතිංකිත තොම් නිවැරදිව දැක්වෙන වරණය කුමක් ද?

(1) තතිංකිනතොම් (2) තදිං, ගිනතොම් (3) ත, දිං, ගිනතොම්
(4) ත, දිං, ගි, න, තොම් (5) තදිං, ගි, න, තොම්

- ප්‍රශ්න අංක **41** සිට **45** දක්වා ප්‍රශ්නවලට පහත සඳහන් වගුව ඇසුරින් වඩාත් නිවැරදි පිළිතුර සපයන්න.

| රස | දේව | විරුද්ධ රස | වර්ණය | ස්ථායි භාව |
|---|---|---|---|---|
| ශෘංගාර | විශ්ණු | බීභත්ස්‍ය | කොළ | රති |
| කරුණා | A | හාස්‍ය | අළු | ශෝක |
| B | රුද්‍ර | අද්භූත | රතු | ක්‍රෝධ |
| වීර | ඉන්ද්‍ර | C | ලා රතු | උත්සාහ |
| බීභත්ස්‍ය | ශිව | ශෘංගාර | D | ජුගුප්සා |
| අද්භූත | බ්‍රහ්ම | රෞද්‍ර | කහ | E |

**41.** A වලින් නිරූපිත දෙවියන් වනුයේ,

(1) බුදුන් ය. (2) මාර ය. (3) මහාකාලන් ය. (4) ඉන්ද්‍ර ය. (5) විශ්ණු ය.

**42.** B වලින් නිරූපණය වන රසය වනුයේ,

(1) ශාන්ත ය. (2) හාස්‍ය ය. (3) භයානක ය. (4) රෞද්‍ර ය. (5) කරුණා ය.

**43.** C වලින් නිරූපිත විරුද්ධ රසය වනුයේ,

(1) කරුණා ය. (2) හාස්‍ය ය. (3) භයානක ය. (4) අද්භූත ය. (5) ශෘංගාර ය.

**44.** D වලින් නිරූපිත වර්ණය වනුයේ,

(1) සුදු ය. (2) නිල් ය. (3) කොළ ය. (4) කළු ය. (5) කහ ය.

**45.** E වලින් නිරූපිත ස්ථායි භාවය වනුයේ,


(1) භය ය. (2) හාස ය. (3) ශෝක ය. (4) විශ්මය ය. (5) ක්‍රෝධ ය.

Past Papers Wiki



**46.** මෙම රූපයේ දක්වා ඇති වාද්‍ය භාණ්ඩය.................. වේ.

(1) මද්දලය
(2) මෘදංගය
(3) තප්පු
(4) තවිල්
(5) පරෛ



**47.** මෙම රූපයේ දක්වා ඇති නර්තන ශිල්පියා.................. වේ,

(1) ගීතාංජලී වී.කේ. නල්ලයියා
(2) බ්‍රහ්ම ශ්‍රී වීරමනී අයියර්
(3) න. රාසරත්නම්
(4) ක. තොම්මක්කුට්ටි
(5) ම. කයිලාය පිල්ලෛ



**48.** මෙම රූපයේ දක්වා ඇති භරත නර්තන ආභරණ.................. වේ,

(1) රාක්කොඩි, කුංජම්
(2) ජිමික්කි, කාදු මාට්ටි
(3) නෙත්තිවරි, උච්චිවරි
(4) පුලාක්කු, නත්තු
(5) චන්ද්‍ර පිරෛ, සූරිය පිරෛ



**49.** මෙම රූපයෙන් නිරූපිත ශාස්ත්‍රීය නර්තන සම්ප්‍රදාය.................. වේ.

(1) කතකලි
(2) කතක්
(3) මණිපුරි
(4) කුච්චිපුඩි
(5) සබරගමු නැටුම්



**50.** මෙම රූපයෙන් දැක්වෙන නර්තන අංගය වනුයේ .................. වේ.

(1) මානාට්ටම්
(2) පුලියාට්ටම්
(3) මයිලාට්ටම්
(4) බොම්මල් ආට්ටම්
(5) කුදිරෛ ආට්ටම්



* * *

PAST PAPERS
WIKI

Past Papers Wiki



සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved]

නව නිර්දේශය/புதிய பாடத்திட்டம்/New Syllabus

NEW

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2019 අගෝස්තු
கல்விப் பொதுத் தராதரப் பத்திர (உயர் தர)ப் பரீட்சை, 2019 ஓகஸ்ற்
General Certificate of Education (Adv. Level) Examination, August 2019

නර්තනය (භරත) II
நாட்டியம் (பரதம்) II
Dancing (Baratha) II

53 S II

2019.08.08 / 0830 - 1140

පැය තුනයි
மூன்று மணித்தியாலம்
Three hours

අමතර කියවීම් කාලය - මිනිත්තු 10 යි
மேலதிக வாசிப்பு நேரம் - 10 நிமிடங்கள்
Additional Reading Time - 10 minutes

අමතර කියවීම් කාලය ප්‍රශ්න පත්‍රය කියවා ප්‍රශ්න තෝරා ගැනීමටත් පිළිතුරු ලිවීමේදී ප්‍රමුඛත්වය දෙන ප්‍රශ්න සංවිධානය කර ගැනීමටත් යොදාගන්න.

**උපදෙස්:**

✻ I කොටසේ **පළමුවන** ප්‍රශ්නය ඇතුළු ව ප්‍රශ්න **දෙකක්** ද II කොටසින් ප්‍රශ්න **තුනක්** ද තෝරාගෙන ප්‍රශ්න **පහකට** පිළිතුරු සපයන්න.

## I කොටස

**1.** (i) ඔබ උගත් පද වර්ණම් අංගයක තාලය සහ රාගය සඳහන් කරන්න. (ලකුණු 02යි.)

(ii) ඔබ උගත් පද වර්ණම් ගීතයක රචකයා හා නර්තන නිර්මාපකයා සඳහන් කරන්න. (ලකුණු 02යි.)

(iii) එහි පළමුවන චරණම් ස්වර කෝර්වෙ තාල අංග සංකේත සමග ලියා දක්වන්න. (ලකුණු 06යි.)

(iv) එහි පළමුවන තීර්මාණම් තාල අංග සංකේත සමග ලියා දක්වන්න. (ලකුණු 10යි.)

**2.** (i) කුච්චිපුඩි නර්තනයේ ප්‍රභවය සඳහන් කරන්න. (ලකුණු 03යි.)

(ii) කුච්චිපුඩි නර්තනයේ වේශභූෂණ ක්‍රම ශිල්ප සඳහන් කරන්න. (ලකුණු 03යි.)

(iii) කුච්චිපුඩි නර්තන ශිල්පීන් දෙදෙනෙකු නම් කර එහි භාවිත වාද්‍ය භාණ්ඩ ලියා දක්වන්න. (ලකුණු 04යි.)

(iv) කුච්චිපුඩි නෘත්‍ය නාටක පිළිබඳ විස්තර කරන්න. (ලකුණු 05යි.)

(v) කුච්චිපුඩි නර්තනයේ සංවර්ධනය පිළිබඳ සවිස්තරාත්මකව දක්වන්න. (ලකුණු 05යි.)

**3.** (i) තාල දස ප්‍රාණ දක්වන්න. (ලකුණු 02යි.)

(ii) ජති යන්න අර්ථ දක්වන්න. (ලකුණු 03යි.)

(iii) ජති වර්ග සඳහන් කරන්න. (ලකුණු 03යි.)

(iv) ජති වර්ග සවිස්තරාත්මකව පැහැදිලි කරන්න. (ලකුණු 12යි.)

## II කොටස

**4.** (i) සප්ත තාලය සඳහන් කරන්න. (ලකුණු 02යි.)

(ii) සප්ත තාලයේ තාලාංග සංකේතාත්මකව දක්වන්න. (ලකුණු 03යි.)

(iii) සප්ත තාල 35 සැකැස්ම නිදර්ශනාත්මකව පැහැදිලි කරන්න. (ලකුණු 05යි.)

(iv) සප්ත තාල 35, 175 ක සැකැස්ම නිදර්ශනාත්මකව පැහැදිලි කරන්න. (ලකුණු 10යි.)

**5.** (i) සංගම් යුගයේ නර්තන ශිල්පීන් නම් කරන්න. (ලකුණු 02යි.)

(ii) එම යුගයට අයත් කුරවෛ, තුනංගෛ, වෙරියාට්ටු යන අංග පිළිබඳ වෙන් වෙන් වශයෙන් පැහැදිලි කරන්න. (ලකුණු 08යි.)

(iii) සංගම් යුගයට අයත් නර්තන, ජන ජීවන පැවැත්ම හා බද්ධ වූ ආකාරය නිදසුන් සහිතව පැහැදිලි කරන්න. (ලකුණු 10යි.)

[ දෙවැනි පිටුව බලන්න.

**6.** පහත සඳහන් අංග සඳහා කෙටි සටහන් ලියන්න.

(i) මගිඩික්කුත්තු

(ii) කලා ක්ෂේත්‍රා

(iii) අභිනය දර්පණය


(iv) දූතයාගේ ගති ලක්ෂණ

(ලකුණු 05 × 4 = 20යි.)


**7.** කලෙලෙව්වෙල්වන් ඒරම්බු සුප්පයියාගේ ජීවන තොරතුරු සඳහන් කර එතුමා කලාවට සිදු කළ සේවාව පැහැදිලි කරන්න. (ලකුණු 20යි.)

**8.** "ග්‍රාමීය කලාව ගැමි ජනයාගේ ආගමික සහ සමාජීය ජීවන රටාව සමග ඒකාබද්ධ වී ඇත" යන ප්‍රකාශයෙහි වලංගුතාවය පැහැදිලි කරන්න. (ලකුණු 20යි.)

* * *



Store
වාරෙටම ඕන කරන පොත්
ඕඩර් කරලා දැන් ගෙදරටම
25% OFF
ALL BOOKS
Including Exercise Books,
CR Books, and B5 Books
අභ්‍යාස පොතකට 25%ක විශේෂ
ORDER BOOKS FROM LOL BOOKS STORE


ORDER GCE A/L SHORT NOTES, MODEL, REVISION BOOKS & PAST PAPERS IN SINHALA, ENGLISH & TAMIL MEDIUM
LOL BOOK STORE
CASH ON DELIVERY AND KOKO PAYMENT AVAILABLE
WHATSAPP - 0717774440
WEBSITE: WWW.LOL.LK
GET READY FOR YOUR A/Ls